# ලත් මිනිසත් බවේ උතුම්ම අභිලාශය නිවන් මග විවෘත කර ගැනිමයි

**බණ්ඩාර කපුගෙදර**
විශ්‍රාමික අධ්‍යාපන අධ්‍යක්ෂ
අති. අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස්

**පසුගිය කළාපයෙන්**

ඇස → වර්ණ රූප උපාදනය සමඟ
වේදනා සංඥා සංඛාර විඥනය
කන → ශබ්ද රූප උපාදනය සමඟ
වේදනා සංඥා සංඛාර විඥනය
නාසය → ගන්ධ රූප උපාදනය සමඟ
වේදනා සංඥා සංඛාර විඥන
දිව → රස රූප උපාදනය සමඟ
වේදනා සංඥා සංඛාර විඥන
ශරීරය → ස්පර්ෂ උපාදනය සමඟ
වේදන සංඥා සංඛාර විඥන

මෙනයින් සංඥා නිරෝධ වෙනුවට රෝධ කිරීම තුල ප්‍රජාව ක්‍රියාවලියට බැදෙනුයේ අවිද්‍යාව මූලික තණ්හාව නිසාය. මෙම පංච උපාදන ක්‍රියා වලියේ ප්‍රතිඵලය කුමක් ද? මනසට පූර්ව දත්ත පාදකම විඥනය තහවුරු කර ගැනීමයි. මෙහි සාධා-නක තත්වය නම් ''මම'' නැමැත්තා සම්මුති ලෝකයේ ඉපදීමයි. දුකඛ සත්‍ය විග්‍රහයේ දී ජාති හෙවත් ''මම'' උපත සමඟ ජරා ව්‍යාධි මරණ ශෝක පරිදේව ආදී සියළු දුක තහවුරු වන නිසයි. බුදු පියාණන් පංච උපාදනයම දුකයැයි වදලේ මෙම උපාදන ක්‍රියාවලිය සතර ආකාරයකට සිදු-වන බැව් දේශනය. එනම් කාම උපාදන දිට්ඨි උපාදන - සීලබවත උපාදනය - ආතත වාද උපාදනය ආදී වශයෙනි. බුදු දහමේ මූලික අරමුණ සත්වයා සසර මෙ මනා දුක්කන්දරාවෙන් නිදහස් කිරීමයි. ''මම'' යනු මිථ්‍යාවෙන් මුලින් නිදහස් විය යුතුය. - ඒ සඳහා අවිධ්‍යවෙන් සිත තුල ජනිත සක්කාය දිට්ඨියෙන් නිදහස් විය යුතුය. ''අවිජ්ජා පරමං මලං'' සසරට බැඳ තබන ප්‍රධානතම රැහැන අවිද්‍යාවයි. සම්බුද්ධ පරමාර්ථ දේශනා සියල්ල ඉලක්ක වුයේ පුද්ගලයා ''මම'' යන මිථ්‍යාවෙන් නිදහස් කර ගැනීමයි. ආර්යය පර්යේෂණය කල එතුමා විසින් අවිද්‍යාව නමැති මඩුව විසින් තෘෂ්ණාව නමැති රැහැන් යොදා ''මම'' නැමැති ගෙය නිර්මාණ කරන බැව් දුටු බෝසතුන් සකස් නොවන ගත හා සිත දුටු බැව් ''විසංඛාර ගතං චිතතං'' අකුප-පාමේ චේතො විමුක්තියා'' තෘෂ්ණාව ක්‍ෂය කිරීමේ ප්‍රතිඵලය ලෙස සංඥා සමුදය තුළම නිරෝධය ප්‍රත්‍යක්‍ෂ කල උතුමා සම්මුති ලෝකයේ යථාර්ථය ශූන්‍යතාව බැව් ප්‍රකාශ කළහ. පේණපිණ්ඩු සම සුත්‍රයේ ද පේන පිණඩුමං රූපං - වේදනා බුබ්බුලු පමා සංඥා මරීචිත්‍යය - සංඛාර කදුලු පමා මාශ්‍රි මජ්මාච විඤ්ඤනං ............ ආදී

ලෙස පංච උපාදනය තුල ''මම'' හුදෙක් මායාවක් ලෙසම දැකිය යුතුය. මෙම දැක්ම ඉන්ද්‍රිය ශුන්‍ය තුළ නොමැති අතර අතීන්ද්‍රිය ශූන්‍ය හෙවත් ප්‍රඥව උපදවා ගැනීමෙන් අවබෝධ කල යුත්තකි. 'මම'' නමැති අවිද්‍යාව දුරු කරගත යුතු ප්‍රවේශය පැහැදිලි කරමින් ...........

**අතීතංවා නාගංයය - නපපටිකංඛෙ අනාගතා**
**යදනීතං ජහීනථං - පච්චුපපනන යේ ධම්මං**

තතථ තතථ විපස්සති - සැබැවින් මේ මොහොත දමා අතීතය අවසන්ය. අනාගතය තවම පැමිණ නැත. අතීතයේ ''මම'' නැත. අනාගතයේ ''මම'' තවම නැත. මේ මොහොතේ ''මම'' ලෙස ගන්නා විගන මායාව එතැනම අවසන් වන අයුරු ප්‍රඥවෙන් දැකීම සත්‍යාවලෝකනයයි. භදෙකරතන සුත්‍රයේ දැක්වෙන අයුරු ''මම'' නැමැත්තාගේ පැවැත්ම ඇත්තේ මෙම බුද්ධොත් පාද ක්‍ෂණයේ පමණි. එනම් බුද්ධිං උත්පාදවූ මේ මොහොතේය.

**"දුලභෝ ක්‍ෂණ සම්පතකි" මෙයින් අදහස් කෙරෙන්නේ සංසාර ගමන සක්‍රිය කරන මොහොත මේ ක්‍ෂණය පමණක් බවයි.**

**"අපෙහි වකකලී කිංතෙ පූතිකායේ - යෝ පටිච්චි සුමුපපාදං**
**පසසති - සො ධමමං පසසති - සො ධමමං පසසති**

සො මං පසසති'' මෙම කදිම බුදු වදන ප්‍රඥා ගරුක ලෙස සලකා බලන්න. බුදුන් බාහිරව දැකිය හැකිද? අධ්‍යාත්මය තුලින් ප්‍රඥවෙන් පමණක් බුද්ධ අවබෝධය තුළ බුදුන් දැකිය යුතු බවයි. බුද්ධෝත් පාදය තුලින් දුර්ලභ තෘෂ්ණා සම්පත්තියට ප්‍රවේශව තෘෂණා භංගත්වය දැකීමට බුදුන් දැකීමයි. අප කාලය ගණනය කරන්නේ පෘථිවි භ්‍රමණය හා පරිභ්‍රමණ ක්‍රියාවලිය තුලය. ඉහත කී වර්තමාන ක්‍ෂණය පැවතී මම නම් පෘථිවි භ්‍රමණ ක්‍රියාවලිය මොහොතකට නතරවිය යුතු නේද? එසේ සිදුවේද? යම් මොහොතක සිදුවොත් පෘථිවි නැමති ග්‍රහවස්තු ගැටී සුනු විසුනු නොවේද? සිතා බලන්න. මේ නිසයි බුදු දහම අකාලික වශයෙන් දක්වා ඇත්තේ.

අප උපතේ සිට බැදී සිටින ''මම'' ගත හා සිත එකතුව නේද? සිත පවත්නේ මේ තෘෂණය තුළ පමණි. එය අභිධර්මයේ චිත්තාක්‍ෂණය ලෙස දක්වයි. නමුත් සිත පවත්නා යථාර්තය හටගත් ක්‍ෂණයේම නැති වි යාමයි. සමුදය තුළම නිරෝධයයි නමුත් ස්වභාවය නම් යලි එට ගැනීම හා නිරෝධයයි. විදුලි බුබුල දැල්වී ඇති තත්ප-රයක පනස්වාරයක් නිවෙන බව පෙනේද? නැත එසෙයින් අප හඳුනා ගන්නේ මෙම සිත අඛණ්ඩව පවතින බවයි. විභඟුනට නමැති මායාවට හසුවූ බවට වැටහෙන්නේ ඒ අයුරිනි. චිත්තාක්‍ෂණ දෙකක් සසර ගමනේ කිසි මොහොතක එක් නොවීම මෙහි සනාතන මූලධර්මයයි. එසේ නම් සිතක් සකස් වේද? 'විසංඛාර ගතං චිත්තෝ ලෙස බුද්ධ උදනයේ දී ප්‍රකට කලේ මෙම දහමයි.

අප සිත ලෙස පවත්වා ගන්නේ අවිද්‍යාවෙන් අනවබෝධය හදගත් මයාකාරී විඥනයම බැව් වටහා ගන්න ගත හෙවත් සිරුර පිළිබඳ සොයා බලමු. බාහිරයේ පවතින භෞතික සියල්ලම පෘථිවියේම කොටස් නේද? මේ සිරුර නිර්මාණය වී ඇත්තේ පෘථිවියේ ගසකොළ හා සත්ත්ව සම්පත තුළින් ලබාගත් කිරි ආහාරදිය තුලින් නේද? භෞතිකය තුල ඔබ දකින ලෝකය සතර මහා භූත සංයුතිය නම් එම සංයුතියේ නිරන්තර ක්‍රියාදමය තද කොටස් වැගිරෙන මූලධර්මය හා ගැටී විනාශ-වේ. එසේ උණුසුම හා වායෝගතිය එකට ගැටේ. ඒ තාක්ෂණයේ ඒ සියල්ල විනාශවේ. ගත සිරුර හැදී ඇත්තේ මෙම මූල ධාතු සංයුතියෙනි. එවිට පවතින ගතක් යථාර්තය තුල පවතීතද? බුදුහු භදෙදකරනීය සූත්‍රයේ දී සැබවින්ම මුළු ලෝකයම විඥනය තුළ පවතිනා මායා ජාලයක් පමණක්ම බැව් බුදුහු වදලහ. මෙම මායා ජාලය පදනම් න්‍යාය

**"ඉමසම්ං සති ඉධංහොතී - ඉමාස උපපදු ඉධං උපපජ්ජති**
**ඉමාම්ං අසති ඉධං න හෝති - ඉමාස නිරෝධා ඉධං නිරුජාති**

මෙම බුද්ධ න්‍යාය මත, ඇස කන ආදී ඉඳුරන්ට හේතු පත්‍ර්‍ය ලෙස උපදනි සංඥව තුලින් විඥනය උපදී - එම සංඥව එකෙනෙහිම නිරෝධ වේ. එවිට විඥනය ප්‍රත්‍යක්ෂ්‍ය කොට සැකසෙන ''මම'' අතුළු බාහිරයට - සම්මුතිය ද නිරෝධ වේ. මො-හොතකට නිතර අවිද්‍යාව - අනවබෝධය ප්‍රත්‍ය කොට බාහිර සම්මත ලෝකය පුරා දුවන සිත නතර කොට මෙහි සත්‍යතාව මෙනෙහි කරන්න.

සම්බුදුහු තේවට්ට සූත්‍රයේ දී -

එතථ පඨවි ආපෝ තේජෝ වායෝ නගාධති විඤ්ඤනසස නිරෝධෙන එතෙසං උපරුජාංධති" මේ මඟින් ක්‍රි.පූ 6වෙන සියවසේ භාරතීය පසුබිමේ පැවති බාහිර ලෝකය මූලධාතු 4 මත සංයුත වී පැවතියා යන දුර්මතය ද ප්‍රතික්ෂේප කළහ. සිදුහත් බෝසතාණන් වෙසක් පුන් පොහෝ දින බුද්ධ ගයාවේ දී අරියය පරිංය සනයේදී ක්‍ෂරයක් පාසා උදවන ප්‍රභාෂ්වර මනසට භාව - නාව, සිතිවිලි නො එන තැනට සිහිය උපදවා ගැනීමයි. "අකුපපාමේ චේතො විමුතතිධා - ලෙස සිතුවිලි උපදවීම" පූර්ණ ලෙස නැති කිරීමේ ප්‍රතිඵලය කුමක්ද ? පසිඳුරන් කරා හේතුඵල න්‍යාමය ලෙස ගලා එන සංඥා රූප එතැනට නිරෝධවන බවයි. සංඥා නිරෝධ වූ විට විඥන නිරෝධය එතැනට සිදුවේ. එකෙනෙහිම පටිච්ච සමුපපන්ව නිරෝධය ඥණ භාවිතයක් ලෙස ප්‍රඥවෙන් දැකීම නිර්වාණ අවබෝධයයි.

ලොව්තුරා බුදු පියාණන් භවචක්‍රය බිඳ දමා දහම් ඇස ධම්මචක්‍රය පහළ වීම චඛුං උදපාදී ඥණං උදපාදී පංඥා උදපාදී විජ්ජා උදපාදී ආලෝකෝ උදපාදි ලෙස උදම් ඇනීම කළහ. එය බුද්ධෝත්පාද යයි බුද්ධිය උත්පාදනයි. උන්වහන්සේ තමා තුලින් ඕපනයිකව අත් දුටුවේ කුමක් ද? පටිච්ච සමුප්පාදයේ සමුදය හා නිරෝධයයි. එය සාක්‍ෂර තාවයයි. යං නිකුච් පිටිචච් සමුපාදයේ සමුද්‍ය හා නිරෝධයයි. එය අවබෝධයද උතුම් දහමයි.

මේ අනුව අවිද්‍යවෙන් හේතුප්‍රත්‍ය පසිඳුරන් හා ගැටෙන වර්ණ ශබ්ද ගන්ධ රස හා ස්පර්ෂ රූප වේදනා සංඥා සංඛාර හා විඥන ගත කිරීම තුළ මත හා බැදෙන ආස්වාදයට දුක්ක සත්‍යයි. එසේම ආසසාදය ප්‍රත්‍යකොට කාම භව විභව වශයෙන් ඇති කර ගන්නා තණ්හාවට පටිච්ච සමුප්පාදය දුක්ඛ සමුදය සත්‍ය කරගන්නා තණ්හාවට පටිච්ච සමුපනාව දුක්‍ය සුමදය සත්‍ය මෙහි ආදීනවය දැක නිසසරණය දුක්ඛ නිරෝධ සත්‍ය වන අතර ආර්යය අෂ්ඨාංගික මාර්ග යේ ශ්‍රී ශංෂා ශීල සමාධි ප්‍රඥා වශයෙන් එළැඹි මනා සිහියෙන් යුතුව රූප නැමැති මිරිඟුව සමුදය තුලම නිරෝධ වන ආකාරය ප්‍රත්‍යක්‍ෂ වීම දුක්‍ය නිරෝධ ගාමිණී පටිපදා ආර්යය සත්‍යයි.

මෙම නිවන් මග සමාප ෂනයේ දී ඒ සඳහා සුවිශේෂි වනු දරා නවගතවීම කොට කළ යුත්තේ මොහොතක් පාසා තම සිහියට අවදිව ලෝකයේ කෙනෙකු නොමැතිව එහෙත් පටිච්ච සමුපානාව සිදුවන සමුදධ හා නිරෝධය පිළිබඳව ධීමතාවය ප්‍රභූ සම්ප්‍රදයික සිහියෙන් දැකීමයි. මෙහිලා ''ආයයී තුනහීභාවො'' උතුම් නිභඩතව ක්‍රමවේදයයි. ලොව්තුරා බුදුහු භික්‍ෂුනී සංයුතිතතයේ දී

නයිධං අතථ කථං බිම්භං - නයිධං පරකතතං අගං
හේතුං පටිච්ච සම්භූතං - හේතු භයිගා නිරුධක
සියල්ල සිදුකරන ''මම'' නැමැත්තෙකු හෝ නැති බවත්. හේතු ඵල දහමක් සිදුවන සමුදය හෙවත් හට ගැනීම හේතුව එම දුක්ඛ නිරෝධ සමඟම ඵලයද එකෙනෙහිම හේතුව එම නිරෝධය සමඟම ඵලය ද එකෙනෙහිම නිරුධ වන බවයි. ආර්යය උතුමන් නිර්මාණගාමී ප්‍රත්‍යක්ෂ අවබෝධයට පත් වුයේ මෙම උතුම් දහම සාක්ෂාත් කිරිමේ ප්‍රතිඵලය වශයෙනි.

